# ලංකාවේ යළිත් එල්ටීටීඊ ය නඟාසිටුවීමේ වෑයමක්

සමන් ගමගේ

**ඉලක්කය මෛත්‍රී සහ ගෝඨා...කොටි දොස්තර සියල්ල වමාරයි.... ප්‍රහාරවලට ස්නයිපර්කරුවනුත් සොයලා...!**

- **මොසාඩ් ක්‍රමයට හමුදා ප්‍රධානීන් ඝාතනයටත් සැලසුමක්**
- **කොටි පුහුණුව ගත්තේ මඩකලපුවේදී**





කොටි දොස්තර සින්නයියා

පරගැති දේශපාලනික කෙරුවාවක් තුළ ගෙවී ගිය වසර පහකට ආසන්න කාලයේ මේ රටේ ජාතික ආරක්ෂාවට සිදු කළ විනාශය හමුවේ අපි දැන් යළිත් බිහිසුණු බවේ උච්ඡතම අවස්ථාවට ළඟා වී සිටිමු. මේ රටේ ජනතාවගේ වැටහීම පිණිස ඒ බව අප සටහන් කරනුයේ ඉතා වගකීමෙනි. මිනිසුනේ සිහිතබා ගන්න. අවධානයෙන් සිටින්න. යළිත් අපට මරණය දෝතට ගෙන ජීවත් වීමට සිදුවන වටපිටාවක් නිර්මාණය වෙමින් ඇත. එල්ටීටීඊ ත්‍රස්තවාදය අප යුදමය වශයෙන් මේ රට තුළ පරාජයට පත් කරනු ලැබුවේ ඉකුත් 2009 වසරේ මැයි මස 19 වැනිදාය. එතැන් සිටි මේ රටේ ජීවත් වූවන්ගේ හදවත් හිරිවට්ටවා තිබූ මරණයේ භීෂණය ඉවතට ගියේය. එහෙත් ඒ නිදහස පැවතියේ දස වසරක කාලයක් පමණකි. ඉකුත් පාස්කු ඉරිදා ප්‍රහාරය එල්ල කළ තව්හිද් ජමාත් ත්‍රස්තවාදය යළිත් අපට ඒ රුදුරු මරණයේ තරම සිහිකර දුන්නේය. ඒ අනුව දැන් කාගේත් මාතෘකාව බවට පත්ව ඇත්තේ තව්හිද් ජමාත් ත්‍රස්තවාදය සහ සහරාන් හෂීම්ය.

එහෙත් මේ මොහොතේ රට ඇත්තේ තව්හිද් ජමාත් ත්‍රස්තවාදය හා සහරාන් හෂීම්ගේ භීෂණයේ ගොදුරක් බවට පත්වී පමණක්ද? නැත. ඊටත් එහා ගිය අතිශය බිහිසුණු මාවතක් දෙසට දැන් එල්ටීටීඊ ත්‍රස්තවාදය යළිත් මේ රට රැගෙන යමින් තිබෙන්නේය.

එල්ටීටීඊ ත්‍රස්තවාදීන් කෙසේ හෝ යළි හිස ඔසවන්නට උත්සාහ ගනු ලැබුවේ ප්‍රභාකරන්ගේ අවසානය සිදුවී තෙවසරක් ඇවෑමේ ඉකුත් 2012 වසරේ සිටය. ඒ ආරම්භය ගනු ලැබුවේ ප්‍රබල හමුදා ඔත්තුකරුවකු වූ ඊපීපී මුත්තු නමැත්තා ත්‍රිකුණාමලය වැව්බැම්ම මතට රැගෙන ගොස් ගෙල කපා ඝාතනය කිරීමෙනි. එතැන් සිට ඔවුන් ඉකුත් 2015 වසර දක්වා අවස්ථා තුනකදීම එසේ යළි මතුවීමට උත්සාහ ගනු ලැබීය. එහෙත් ඒ වන විට මේ රටේ ආරක්ෂක බුද්ධි අංශ ජාලය ඉතාම ශක්තිමත්ව පැවති නිසා ඒ සියල්ල ව්‍යාර්ථ වී ගියේය.

ඉකුත් 2015 වසරින් පසු මේ රටේ බුද්ධි අංශවලට උදා වූයේ ඉතාම අවාසනාවන්ත යුගයකි. කාලකණ්ණි දේශපාලන වුවමනාවන් හමුවේ විවිධ චෝදනා එල්ල කරමින් එකාපිට එකා සිරගත කිරීමේදී ඔවුහු බිංදුවටම ඇද වැටුණාහ. එසේ වුවද බොහෝ තාඩන පීඩන දුක් කම්කටොළු මැද වුවද රටත් ජනතාවත් විපත දෙසට ඇදී යන බව දුටු කල්හි හැකි පමණින් උපන් බිමේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට ඔවුහු පෙරමුණ ගත්හ.එසේ නොවන්නට මේ බිමේ යළි එක පෙළට මළ මිනී එසැවෙන්නට තිබුණේ සහරාන් හෂීම්ගේ ප්‍රහාරයට පෙරය. මරාගෙන මැරෙන කොටි ත්‍රස්තවාදියකු වූ එඩ්වඩ් ජුලියන්ගේ නිවසේ තිබී ඉකුත් 2016 වසරේ මාර්තු මස 29 වැනිදා ආරක්ෂක අංශ මගින් සොයාගනු ලැබූ අධිබල ක්ලේමෝ බෝම්බ ඇතුළු පුපුරන ද්‍රව්‍ය තොගය පිපිරීමෙන් ජාතියට ඒ ඉරණම අත්වීමට බොහෝදුරට ඉඩ තිබිණි.

එසේම ඉකුත් 2018 වසරේ ජුනි මස 21 වැනිදා ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේදී අහම්බයකින් මෙන් හසු වූ ක්ලේමෝ බෝම්බය ඇතුළු පුපුරන ද්‍රව්‍ය යොදාගෙන එල්ල කරන එල්ටීටීඊ ප්‍රහාරයකින් ද එය සිදු විය හැකිව තිබිණි. එහෙත් එසේ නොවීය. කොටි ඩයස්පෝරාවේ සහ විජාතික වුවමනාවන් අනුව යමින් රට පාලනය කළ මජර දේශපාලනය බුද්ධි අංශ අඩපණ කිරීම සඳහා කළ කී දේ අන්තිම නින්දිත වුවද ආණ්ඩුව තමන්ට එල්ල කරනු ලබන ප්‍රහාරය හමුවේ දිනෙන් දින එල්ටීටීඊ ත්‍රස්තවාදය යළි හිස ඔසවමින් තිබෙන බව අවබෝධ කරගත් බුද්ධි නිලධාරීහු බොහෝ බාධක මැද රටත් ජනතාවත් වෙනුවෙන් ක්‍රියාත්මක වන්නට වූහ.

එහිදී ආරක්ෂක බුද්ධි අංශ මගින් නැති එල්ටීටීඊ ත්‍රස්තවාදයක් මවා පා ආණ්ඩුව පෙරළා දමන්නට කටයුතු කරමින් සිටින්නේ යැයි ලෙසින් අසත්‍යයට තටු දෙමින් ආණ්ඩුව නොමඟ යවා තවදුරටත් බුද්ධි අංශ අඩපණ කිරීමට පොලිස් ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාසයේ ප්‍රධානියාව සිටි නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා ඇතුළු ඇතැම් නිලධාරීන් ගත් උත්සාහය ද සුළුපටු නොවීය.ඔවුන් සම්පූර්ණයෙන් අසත්‍ය මත පදනම්ව කී එවන් කතා ආරක්ෂක මණ්ඩලය දක්වාම ගෙන ගියේය. එහිදී රජයේ සැකය එල්ල වූයේ ආරක්ෂක බුද්ධි අංශ වෙතටය. ආණ්ඩුවේ ඇතැම් දේශපාලනඥයෝ ප්‍රසිද්ධියේ බුද්ධි අංශ වෙත චෝදනා කරන්නට ද වූහ. එසේ වුවද ඉකුත් 2018 වසරේ ජුනි මස 21 වැනිදා ත්‍රිරෝද රථයකින් ගමන් කරමින් සිටි ත්‍රස්තවාදීන් පිරිසක් ක්ලේමෝ බෝම්බ ඇතුළු පුපුරන ද්‍රව්‍ය තොගයක් සමග කොටුවීමත් සමග මතුවෙමින් තිබෙන තත්ත්වය එතරම් සුබදායක නොවන බව බුද්ධි අංශ අවබෝධ කරගනු ලැබීය. මෙකී ඔඩ්ඩුසුඩාන් සිද්ධිය පිළිබඳ බුද්ධි අංශ සිදුකළ විමර්ශනයේදී එහි මහමොළකරුවන් බවට පත්ව සිටියේ දිනේෂ් සහ කරන් නමැති කොටි ත්‍රස්තවාදීන් දෙදෙනකු බව බුද්ධි අංශ හෙළි කරනු ලැබිණි. එසේම ඔවුන් ක්‍රියාත්මක වූයේ අවසන් සටනේදී ඉන්දියාවට පැන ගිය එල්ටීටීඊ සන්නද්ධ නායකයකු වූ සිරංජි මාස්ටර්ගේ සැලසුමකට අනුව බව ද එහිදී අනාවරණය විය.ඒ ඔස්සේ වැඩිදුරටත් බුද්ධි අංශ සිදුකළ විමර්ශනවලදී අනාවරණය වූයේ ඔඩ්ඩුසුඩාන් සිද්ධිය වන විට එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සඟවා තිබියදී ගොඩගනු ලැබූ ස්නයිපර් වර්ගයේ ගිනි අවි දෙකක් අතුරුදන්ව ඇතැයි යන්නය. එකී ස්නයිපර් ගිනි අවි දෙක එල්ටීටීඊය විසින් නැවත ගෙන තිබුණේ ප්‍රභූ ඝාතනයක් සඳහා බවද හෙළි වී තිබිණි.



එය හෙළි වූයේදී ප්‍රබල එල්ටීටීඊ ත්‍රස්තවාදියකු වූ චන්ද්‍රමෝහන් නමැත්තකුගේ මවට කොටි ඩයස්පෝරාව මගින් කූමාන්කුලම් ප්‍රදේශයෙන් මිලට ගෙන දුන් නිවසක් පිටුපස බැරල් දෙකක ස්නයිපර් වර්ගයේ ගිනි අවි දෙකක් සඟවා තිබෙන බවට ලද තොරතුරක් මත එම අවි දෙක සොයා ගැනීමට බුද්ධි අංශ එහි ගිය අවස්ථාවේ ඒවා අතුරුදන්ව ඇති බව අනාවරණය වීමෙනි.මෙම සිද්ධියත් සමග බිහිසුණු යමකට එල්ටීටීඊය සැරසෙන බව වටහා ගත් බුද්ධි අංශ ඒ පිළිබඳ දැඩි අවධානය යොමු කළේය.එහිදී ඔඩ්ඩුසුඩාන් කොටි ත්‍රස්තවාදීන් සමග වව්නියාව ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්, ප්‍රභූ චරිත, දේශපාලනඥයන් ආදී වශයෙන් පුද්ගලයන්

44 වන පිටට

සන්නස SANNASA CARTOON By PK

